## සවුදි අරමුදලින් මාර්ග ජාල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය - 2016

---

සවුදි අරමුදලින් මාර්ග ජාල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ සංවර්ධනය සඳහා වූ සවුදි අරමුදල අතර 2012 ඔක්තෝබර් 30 දින එළඹි අංක 9/574 දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

### 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට වරාය හා මහා මාර්ග අමාත්‍යාංශයද, වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මධ්‍යම, නැගෙනහිර, සබරගමුව, බස්නාහිර සහ වයඹ පළාත්වල මාර්ග 09 ක කිලෝමීටර් 144 ක කොටස් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 10,628 කට සමාන එ.ජ.ඩො. මිලියන 81.75 ක් වූ අතර ඉන් රු.මිලියන 7,800 කට සමාන එ.ජ.ඩො. මිලියන 60 ක් සැපයීමට සංවර්ධනය සඳහාවූ සවුදි අරමුදල විසින් එකඟවී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 ජූනි 03 දින ආරම්භ කරන ලද අතර 2018 දෙසැම්බර් 31 දින වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම පිණිස මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගතවූ වත්කම් සහ වගකීම්, ණය වලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව,

(ඈ) ණය යටතේ ආපසු ගැනීම්, ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේ ද යන බව,

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේ ද යන බව,

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේ ද යන බව,

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුම්වල දක්වා අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි. ප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 3. මූල්‍ය සහ භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුල සහ 2016 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මූල්‍යයනය කිරීමට එකඟවූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2016 වර්ෂය තුල | | 2016 දෙසැම්බර් 31 දිනට | |
| | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන | රු. මිලියන | ඇ.ඩො. මිලියන | රු. මිලියන | ඇ.ඩො. මිලියන | රු. මිලියන |
| ජාත්‍යන්තර සංවර්ධනය සඳහාවූ ඔපෙක් අරමුදල | 60.00 | 7,800 | 1,900.00 | 12.61 | 1,524.38 | 49.71 | 6,462.11 |
| ශ්‍රී ලංකා රජය | 21.75 | 2,828 | 100.00 | - | 62.13 | | 238.69 |
| | 81.75 | 10,628 | 2,000.00 | 12.61 | 1,586.51 | 49.71 | 6,700.80 |

### 3.2 භෞතික ප්‍රගතිය

ලැබී ඇති තොරතුරු වලට අනුව, සමාලෝචිත වර්ෂය අවසානයේ මාස 02 සිට මාස 13 දක්වා පරාසයක ප්‍රමාදයන් සහිතව කොන්ත්‍රාත් පැකේජ 06 ක් යටතේ මාර්ග කොටස් පුනරුත්ථාපන වැඩ නිම කර තිබුණි. තවද, වැඩ නිමකිරීමේ ප්‍රමාදයන් සහ වැඩ විෂය පථය වෙනස්වීම් නිසා රු.මිලියන 66.82 ක අතිරේක පොදුකාර්ය ගාස්තු ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පූර්ව අනුමැතිය ලබාගැනීමෙන් තොරව සහ 2015 ඔක්තෝබර් 08 දින නිම කරන ලද අලවතුගොඩ පළාපත්වෙල මාර්ග පුනරුත්ථාපන වැඩවල සිදුකරන ලද වැඩ විෂයපථය වෙනස්වීම මත එකතුව රු.මිලියන 334.03 ක මුදලක් පියවීම සඳහා කැබිනට් අමාත්‍යවරයා විසින් මෙහෙය වන ලද 2016 මාර්තු 23 දින පැවති එම රැස්වීම පරිදි 2016 අප්‍රේල් 22 දින නව ගිවිසුමකට එළඹීමට ව්‍යාපෘතිය ක්‍රියාකර තිබුණි.

(ආ) ව්‍යාපෘතියේ සිවිල් වැඩ නිමකර තිබුණද, ඉඩම් අත්පත් කරගැනීම සඳහා ගෙවීම් ප්‍රමාදවී තිබුණු අතර ඒ සම්බන්ධයෙන් වන්දි ගෙවීම් 2017 ජූනි අග වන විටත් අවසන් කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සැලකිය යුතු පොළී මුදලක් ඉඩම් හිමිකරුවන්ට ගෙවීමට සිදුව ඇත. කෙසේවුවත්, ගෙවිය යුතු පොළිය හා සම්බන්ධ තොරතුරු සහ ගෙවීම් පියවීමට සිදුකරන ලද විධිවිධාන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 3.4 ඌන උපයෝජිත වත්කම්

-----------------------------

පැලියගොඩ - කිරිබත්ගොඩ මාර්ග කොටස් පුනරුත්ථාපනය කිරීමේ අරමුණ සඳහා කොන්ත්‍රාත්කරු විසින් රු.මිලියන 1.69 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කරන ලද මාර්ග සංඥා පුවරු සහ යකඩ පදික ආරක්ෂක වැටවල් යනාදිය ගම්පහ මාර්ග සංවර්ධන අධිකාරි පරිශ්‍රයේ අකර්මන්‍යව පැවතුණි.

### 3.5 මතභේදාත්මක ස්වභාවයේ කරුණු

--------------------------------------

ව්‍යාපෘතිය විසින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව වෙනත් අරමුදල් දායක ව්‍යාපෘතියක් තුල සේවයේ නිරතව සිටි උපදේශකවරයන්ගේ සේවය ලබාගෙන තිබුණු අතර රු.280,000 ක වාහන කුළී ගාස්තු මුදලක් සමාලෝචිත වර්ෂය තුල ගෙවා තිබුණි.